# උඩරට රාජධානියේ යුධ හමුදා සංවිධානය


අජිත් තලවත්ත

රාජ්‍යයක ආරක්ෂාවට ස්වභාවික පිහිටීමට සමගාමීව යුද හමුදාවද අත්‍යාවශ්‍ය වේ. ඈත අතීතයේ මෙන් නූතන පාලකයාද බලයට පත්වීමෙන් අනතුරුව සිය බලයත් රටේ ආරක්ෂාවත් තහවුරු කරගැනීමේ අරමුණින් යුද හමුදාව කාර්යක්ෂම සහ ක්‍රමවත් ආකාරයෙන් තබාගැනීමට පියවර ගනී. උඩරට රාජ්‍ය සම්බන්ධයෙන් අවධානය යොමු කිරීමේදී යුද හමුදා සංවිධානයට හිමිවන්නේ විශේෂ ස්ථානයකි. උඩරට රාජධානියේ ස්ථිර යුදහමුදාවක් පැවතුනාද යන්න පිළිබඳ ඉතිහාසඥයින් අතර විවිධ මතවාද පවතියි. විල්හෙල්ම් ගෛගර් මහතා පෙන්වන්නේ මධ්‍යම යුගයේ සිංහල සේනාව අගම්පඩි භටයින් සහ ස්ථිර වශයෙන් යුද්ධ සේවාවේ යෙදී සිටි භටයින් ලෙස දෙපාර්ශවයක් සිටි බවයි. විජේපාල මහතා පවසන්නේ බාහිර සහ අභ්‍යන්තරික විවුල් පැවති බැවින් යුද හමුදාවක් අත්‍යාවශ්‍ය වූ බවයි. මෙම අදහස් තුළින් පැහැදිලි වන්නේ නිත්‍ය හමුදාවක් උඩරට සිට බවයි. ස්ථිර යුද හමුදාවක් අවශ්‍ය වුවා සේම රජුගේ යුද බලය රඳා පැවතියේ ස්ථාවරව පවත්වාගෙන ආ යුද සේනාවට ප්‍රාදේශිය නායකයින්ගෙන් ලැබුණු සහයෝගය නිසාය. මෙම පසුබිම නිසා ප්‍රාදේශිය නායකයන්ට සැලකිය යුතු බලයක් පැවති අතර එය රජුගේ බලය සීමා කිරීමටද හේතු විය.

උඩරට හමුදා සංවිධානයේ ප්‍රධානීන් ලෙස සෙනවියන් වූ අතර ඔවුන්ගේ ප්‍රධානියා වුයේ සෙනෙවිරත්නය. මෙම තනතුර රජුගේ හිතවත් නෑදැයෙකුට පවරා ඇත. ඇතැම් විට මෙම තනතුර අග සෙනෙවි හෝ අදිකාරම් ලෙස හැඳින්වූ බව පෙනේ.[1] අදිකාරම්තුමාට පැවරී තිබූ කාර්යන් ලෙස පරිපාලනමය අධිකරණ සහ යුදමය කටයුතු භාර විය. ප්‍රධාන වශයෙන් උඩරට රාජධානියේ අදිකාරම්වරු දෙදෙනෙකු සිටියත් රාජ්‍ය අවසානයේදී තිදෙනෙකු දක්වා වර්ධනය වී ඇත. දිසාවේවරයා යටතේ හමුදාව රැස්වූ අතර ඔවුන් නිතරම රජවාසලේ අවශ්‍යතාවයන් අනුව ක්‍රියාකාරී වුහ.[2] ඒ ඒ මොහොට්ටාලවරු යටතේ හේවා පයින්ඩවල නාම ලේඛනයක් පැවතිණි.

උඩරට යුද හමුදාවේ ව්‍යුහය පෙර නෙත්තිය හා අපර නෙත්තිය යනුවෙන් කොටස් දෙකකි. පෙර නෙත්තිය ඉදිරියෙන් ගමන් ගත් අතර අපර නෙත්තිය


පසුපසින් ගමන්කර ඇත. මෙම අංශ දෙකෙහි ප්‍රධානියා නෙත්තිආරච්චි නමින් හඳුන්වයි. උඩරට රාජ්‍යයට ආගන්තුක නමුත් ජනප්‍රියව පැවති කාලතුවක්කු සේනාංකය පාලනය කර ඇත්තේ කොඩිතුවක්කු නම් අය බව රොබට් නොක්ස් විසින් පෙන්වා ඇත. රජුට පොලිස් හමුදාවක් සිටි අතර ඔවුන් කටුපුල්ලේ ඇත්තන් ලෙස හඳුනවා තිබේ. ඊට අමතරව දුනුකාරයන්, මඩුවේ ලේකම් යනාදි යුද හමුදාවන්ද සිටියහ.



මහනුවර යුගයේ භාවිතා කරන ලද කෙටේරි

සිංහල යුද හමුදාව කොටස් විස්සකින් සමන්විත විය. එනම් චලන, වෙලන, පිණ්ඩදායක, උග්ගරාජපුත්‍ර, පක්ඛනදී, මහානාග සූර, චම්මයෝධ, දූසතපුත්‍ර, දෞවාරික, කුන්ඨාරිනායක, භේරිවාදක, සංඛමධක, කරෝටයෝද, කුන්තධර, මුග්ගරධර, ඛිංගධර, කෑ මල්ලකාරයෝ, තොයිල්පහේ යන අය මේ පිරිසට අයත් වූහ.[3] උඩරට සමාජ ව්‍යුහය වැඩවසම් සමාජ ක්‍රමයක් මත සැකසී තිබුණ නිසා සේවාකම් පංගු භුක්ති විඳි අය වසරකට පහළොස් දිනක් යුද සේවයෙහි නිරත විය. රටේ අරගල වැඩි වූ සමයෙහි අවුරුද්ද පුරාම සේවය කර ඇත. මෙම හමුදාව පඩිකාරපේරුව සහ ගත්තාපේරුව ලෙස කොටස් දෙකකි. වැටුපට පඩිකාරපේරුව සේවය කළ අතර ගත්තාරපේරුව සේවයේ නිරත වූයේ වාරය මතය. දේශිය භටයන්ට අමතරව රජුට සේවය කළ විදේශික භටයන්ද සිටි අතර ඔවුන් ලස්කිරිඤ්ඤවරු ලෙස හඳුන්වා ඇත.

උඩරට සමාජයේ සෑම කාර්යයක්ම රාජකාරී සේවා මත පදනම් වූ බැවින් ඉඩම නැමති සාධකය ඉතා වැදගත් විය. රජතුමා භූපති වූ බැවින් සියළු ඉඩම් වල අයිතිය ඔහු සතු විය. රජතුමා ඉඩම් ප්‍රධානය කරන අතරම ඒ ඉඩම්වල සේවය සම්බන්ධයෙන් හා සේවයට අමතරව ප්‍රධානය කර ඇත. නමුත් බහුතර ඉඩම් ප්‍රධානය කර ඇතතේ සේවය සඳහාය. රාජකාරී ක්‍රමය යටතේ ඉඩම් භුක්ති විඳින ලද අය හෝ වැටුප් ලබමින් සේවය කළ අය හෝ මගින් උඩරට රජුගේ පෞද්ගලික ආරක්ෂාව හා මාළිගාවේ ආරකෂාව සළසා ඇත. රොබට් නොක්ස් පවසන ආකාරයට රජවාසලේ සෑම දොරටුවකම දොරටුපාළකයෙකු සේවය කර ඇති අතර මුරකරුගේ කාලය අවසන් වූ විට භේරි නාද, සංඛ නාද පවත්වා ඇත. රාත්‍රියේ මුර කිරීම සඳහා සෙබළුන් පමණක් නොව අලි ඇතුන්ද යොදවා තිබේ. රජුගේ ආරක්ෂාවට මැලේ හා තන්ජෝරයෙන් ගෙනා භටයන්ද සිටියහ. 1803 උඩරට ආක්‍රමණයේදී රජුගේ සහයට විශාල මැලේ භටයන් පිරිසක් යොදාගෙන තිබේ. රජුගේ ආරක්ෂාවට දේශිය භටයින්ට අමතරව විදේශිය භටයන් යොදා ගන්නට ඇතතේ රජුද විදේශිකයෙකු වූ නිසාත් දේශිය හමුදාව කෙරෙහි එතරම් විශ්වාසයක් රජුට නොතිබූ නිසාත් වන්නට පුළුවන.




උඩරට රාජධානියට අයත් තුවක්කු

යුද හමුදාව මෙන්ම ආයුධ ද ඉතා වැදගත් වේ. උඩරට රාජ්‍යයේ පැවති ආයුධ අතර කඩු දුනු හෙලි සහ තුවක්කුව ප්‍රධාන විය. ඊට අමතරව ආයුධ වර්ග ගණනාවක් පිළිබඳ තොරතුරු අනාවරණය වේ. එනම් කේබ, කෙලිකෝලේ, ඉස්ටි, කොන්තරය, ත්‍රිශූලය, හෙලායුධය, කිරිච්චිය, වජ්මුෂ්ඨි, තෝමර, කෙටේරි, යාගදාව, පරාවලල්ල සිරිය, කන්සි, තලය, තරවල, කඩුව, තුනි ආයුධය, වනදප්පු, උර්ටිය, ඥාණාවලය, ඊඳඩු, හෙන්මුඩුමලේ, මහත් ඊතලේ, මුගුර, යමුගුර, සොරකොල්ල, ආයුදේ, කලිතොට, දැමුණු, කොලා සවලය සහ අඩයටි යන ඒවාය. රජවාසල හා සම්බන්ධ සේවයේදී කඩුව බහුල ලෙස භාවිතයට ගෙන ඇත.[4] හිස ගසා දැමීමේ කාර්යයේදී කඩුව බහුලව භාවිතා කළ බවට රොබට් නොකස් සඳහන් කරයි. සටන් වලදී දුන්නද අත්‍යාවශ්‍ය විය. වසරකට දින 15 ක් දුනු හටයින් සේවය කළ අතර ඔවුන්ගේ ප්‍රධානියා දුනුකාර ලේකම් ලෙස හඳුන්වයි. පාකර් මහතාගේ අදහස වන්නේ යුද කටයුතු සඳහා පිහියා, මිටි, කඩු මිටිද භාවිතා කළ බවයි. මෙම ආයුධ සෑදීමේදී මිට සඳහා හරක් අං හෝ ඇත්දළ භාවිතා කළ අතර කොට්ටල් බද්දේ කාර්මිකයින් එම කාර්යය සඳහා විශේෂ වූහ.[5] සිරිය සැළකිය යුතු අවියක් වූ අතර මොහොට්ටාලවරු රිදියෙන් කළ ලී මිට සහිත කුඩා සිරි භාවිතා කළහ. රාජ සම්මානයේ සළකුණක් වශයෙන්ද ත්‍යාග ලෙස ද ලබා දී ඇත. පහළ නිළධාරීන් එතරම් අලංකාර නොවූ සිරි පැළඳ ඇත. මන්දාරම් පුවතින් එකල අවි ආයුධ පිළිබඳ බොහෝ තොරතුරු ලබාගත හැකිය.

අරාබි ජාතිකයින් මාර්ගයෙන් තුවක්කු භාවිතය පිළිබඳ ශ්‍රී ලාංකිකයින් දැන සිටියත් විදේශීය ආගමනයත් සමග තුවක්කු භාවිතය ප්‍රචලිත විය. උඩරට පාබල හමුදාවේ වැදගත් සේනාංකයක් වූයේ කොඩිතුවක්කු හමුදාවයි. තෙන්නකෝන් විමලානන්ද පෙන්වා දෙනනේ පෘතුගීසින් සමග යුධ කටයුතු ආරම්භ වීමත් සමග තුවක්කු භාවිතයට හුරුවූ බවයි. ඒ ඒ දිසාවේ කොඩිතුවක්කු හමුදාව කොඩිතුවක්කු ලේකම් යටතේ සේවය කර ඇත. රොබට් නොක්ස් දක්වනේ සිංහලයින් සැකසූ පිත්තල තුවක්කු පෘතුගීසින්ගේ යකඩ තුවක්කුවට වඩා හොඳ මට්ටමක පැවති බවයි. සිංහල තුවක්කු බලඇණිය කාලතුවක්කු හා කොඩිතුවක්කු බලඇණිය යනුවෙන් අංශ දෙකකින් සමන්විත විය. සිංහලයා තුවක්කු භාවිතය පිළිබඳ මනා අවබෝධයකින් සිටි බව පැහැදිලි වන එක් නිදර්ශනයක් ලෙස රෝද සහිත දාරක සවි කරන ලද කාලතුවක්කුව ලෙව්කේ මැතිඳුන් විසින් භාවිතා කළ බවය දැරණියගල මහතා පවසයි. උඩරට රාජ්‍ය සමයේ හමුවන තුවක්කු අතර ගිනි තුවක්කුව, බොන්ඩි තුවක්කුව, කොඩි තුවක්කුව හා පිස්තෝලය වැදගත් වේ. ඉංග්‍රීසින්ගේ ආගමනයත් සමග තුවක්කු භාවිතය වඩාත් ප්‍රචලිත

විය. උඩරට රාජ්‍ය සමය අවසන් වන විට කාල තුවක්කු සඳහා වෙනමම දෙපාර්තමේන්තුවක් පිහිටුවා තිබේ. 1803 උඩරට ආක්‍රමණය අවස්ථාවේ නගරය පුරා කාලතුවක්කු සවි කළ බවට වාර්තා වේ.[6] තුවක්කු හා ඊට අවශ්‍ය වෙඩි බෙහෙත් නිෂ්පාදනය කර ඇත්තේ දේශිය කර්මාන්තකරුවන් විසින්ය.



**යුධ කටයුතු සඳහා භාවිතා කරන ලද හෙල්ල**

සම්ප්‍රදායිකව උඩරට රජුට චතුරංගනී සේනාවක් සිටි බවට තොරතුරු ලැබේ. ගන්නෝරු සටනේදී රාජසිංහ රජු ඇත්, අස්,රිය,පාබල හමුදා යොදාගනු ලැබූ බව සඳහන් වේ. උඩරට යුධ හමුදාවේ විශේෂත්වය වුයේ චරපුරුෂ සේවාවයි. මහනුවර රාජධානියේ අවසන් සමය වන විට රජු හා ප්‍රභූන් අත පැවති අසමගිය නිසා රජුගේ ආරක්ෂාවට චරපුරුෂයින් බහුලව යොදාගෙන තිබේ. උඩරට හමුදාව මුල් අවධියේ එතරම් කාර්යක්ෂම නොවිය. අවශ්‍යතාවයක් ඇති වුවහොත් පමණක් එය සේවයට රැස්කර ඇත. යුරෝපියයන්ගේ පැමිණීමත් සමග කාර්යක්ෂමව හමුදාවකගේ අවශ්‍යතාවට වර්ධනය වුවා විය හැකිය. එයට හේතු වයේ 1632 දෙවන රාජසිංහ රජුට එරෙහිව ගුරුබැවුල නම් ස්ථානයේදී සිදු කළ සටනේදී උඩරට රජුගේ සේනාව තුළ ඉංග්‍රිසි හටයින් සිටි බව කොඩ්රිංටන් මහතා පවසයි.[7] යුද්ධයේදී මරණයට පත් වූවන්ට කෘත ගුණ සැළකීමක් වශයෙන් ගම්වර ප්‍රදානය කර ඇත.



**රෝද සවිකළ කාලතුවක්කු**

ඇතැම් වාර්තාවන්ට අනුව යුද්ධයකට යාමට පෙර සියළු හේවායින් කැඳවා රජතුමාට පක්ෂපාති කර ගැනීමක් සිදුකර ඇත. මේ සම්බන්ධයෙන් තොරතුරු 1583 දී පමණ සිදු වූ සටන් පිළිබඳ තොරතුරු වලින් වාර්තා වේ. තීරණාත්මක සටන් මෙහෙයවීමේදී මෙවැනි දිව්රීමක් රජතුමා විසින් සිදුකර ඇත. ඇතැම් විට යුද්ධයකට පෙර මෙවැනි ඒකඟතාවයක් ඇති කරන්නට ඇත්තේ යුධ හමුදාව නොයෙක් ජාතීන්ගෙන් සමන්විත වූ නිසා වන්නට ඇත. මුලින් සඳහන් කළ පරිදි උඩරට හමුදාවේ මැලේ හා ඕලන්ද ජාතිකයින් කුලියට සේවය කළහ. මෙවැනි හමුදාවකට විශ්වාසය රඳා පවතින්නේ ගෙවනු ලබන දීමනාවන් හී වටිනාකම මතය. සිංහල රජු ඉන්දීය රජු සමග තිබූ සබඳතාවල ප්‍රතිඵලයක් ලෙස කාපිරි භටයින් පැමිණියහ.[8] දෙවන රාජසිංහ රජු කාපිරි සෙබළ මුලක් පිරිවරාගෙන ගිය බවට වාර්තා වේ. ප්‍රධාන වශයෙන් රජුගේ පෞද්ගලික ආරක්ෂාවට මොවුන් යොදවන්නට ඇත.

පුරාතනයේ සිටම සිංහලයාගේ යුද්ධයේ සංකේතය කඩුව වූ අතර සටන් වාහනය ලෙස භාවිතා කළේ හස්තියායි. යුද්ධ සම්පාදන කාර්ය නිලධාරීන්ට භාර වුවද රජතුමාගේ අවශ්‍යතාවයට අනුව සියළු කටයුතු සම්පාදනය කළේය. සෑම කටයුත්තකම අවසන් තීරකයා රජු වූ බැවින් උඩරට ආණ්ඩුව ඒකාධිපති ස්වරූපයක් ගත් බව පෙනේ. රජුට එරෙහිව යුද පිරිස් නැගී සිටියහොත් එය මර්දනය කිරීමට රජු කිසිදු අවස්ථාවක පැකිලුනේ නැත. සාමාන්‍යයෙන් එක් වැසියෙකු වසරකට දින පහළවක් සේවය කිරීම අනිවාර්ය වුවත් යුද කෝලාහල පැවති සමයේ මුළු අවුරුද්ද පුරාම සේවය කර ඇත. දෙවන රාජසිංහ සමයේ දේවාලගම් වැසියන් පවා රජතුමාට වෙඩිබෙහෙත් සැපයූ බව සඳහන් වීමෙන් පැහැදිලි වනනේ යුද්ධය ජනතාවට හිරිහැරයක් වූ බවයි. යුද සේවයට නොපැමිණෙන අය රීදි දෙක බැගින් රජයට දඩ ගෙවා ඇත. පෙර අවදියට වඩා මහනුවර ජනතාව සටන්කාමී වුයේ විදේශිකයන් සමග නිතර ගැටුම් ඇතිකර ගත් නිසාය.[9] වසර ගණණාවක් මෙරට ස්වාධීනත්වය ආරක්ෂා කිරීම සඳහා මහනුවර රාජධානිය පෙරටු කොටගෙන දේශිය යුද භටයින් මහඟු මෙහෙවරක් ඉටු කළහ. 1815 උඩරට බලය ඉංග්‍රීසින් ලබාගත්තද පසු කාලයේ ඇති වූ කැරලි වලදී සිංහල හේවායින් සතුව පැවති යුද ශක්තිය මනාව පිළිබිඹු කර ඇත.

## පාදක සටහන්

(1) රොබට්, නොක්ස්, එදා හෙළදිව, ඩෙවිඩ්, කරුණාරත්න කොළඹ, ගුණසේන සහ සමාගම, 1997, පිටු 175 - 185.

(2) එම, පිටු 180.

(3) ආරියපාල, එම්, බී, මධ්‍යාලීන ලංකා සමාජය, 1967, පිටු, 156.

(4) එම, පිටු 178.

(5) සිංහල සමාජ සංවිධානය, එම, පිටු, 56.

(6) විමුක්ති අරගලය, එම, පිට, 23.

(7) සංක්ෂිප්ත ලංකා ඉතිහාසය, එම, පිටු 195.

(8) තලවත්ත, අජිත්, දිවයින සෙංකඩගල රාජධානියේ යුද හමුදා සංවිධානය, 2003 මැයි, එම , පිටු, 03

(9) එම, පිටු, 03